හලාවත නගර සභාව - **2022**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හලාවත නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුව ඉක්මවා ලැබී තිබුණු මුද්දර ගාස්තු වටිනාකම වූ රු.2,802,186ක් ගිණුම්වලට ගැළපීම් කර නොතිබුණි. | 2023 අවසන් ගිණුමෙන් ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ ණයගිම් කරන ලද සමාලෝචිත වර්ෂයේ ගෙවූ රු.64,755ක විශ්‍රාම වැටුප් මුදල විශ්‍රාම වැටුප් දායක ගිණුමට ගැළපීම් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | කාර්යාල භූමියේ විවේකාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු.670,250ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් සිදු නොවීම සඳහා කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛන අතර එකතු වටිනාකම රු. 22,287,365ක වෙනසක් විය. | වෙනස්කම් 2023 වසරේ අවසන් ගිණුම් සකස් කිරිමේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ලේඛන නිවැරදි කර නිවැරදි ශේෂය ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.385,087,579ක් වූ ගිණුම් ශේෂ 07ක් යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛන, පෙර ගෙවුම් ලේඛන සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | 2023 අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා උප ලේඛනය ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම. | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත 170 වගන්තිය | වර්ෂ 01කට වැඩි කාලයක සිට හිඟව ඇති වරිපනම් බදු හා හිඟ බදු කුලී සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | වරෙන්තු නිකුත් කොට ඉදිරි කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග හා 1978 ජුනි 07 දින 320/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද සංශෝධනය පළාත් පාලන විශ්‍රාම වැටුප් නියෝග 36 වෙනි වගන්තිය. | නිසි ලෙස මාසිකව විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවා නොතිබුණි. | ඉදිරියේ දී හිඟ මුදල ගෙවීමට කටයුතු කරන බව. | නිසි ලෙස මාසිකව විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු කළ අගය මත බදු ගිණුමෙහි වූ රු.2,882,489ක හර ශේෂය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන අවශ්‍ය නිරවුල් කිරීම් සිදුකර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එම ආයතනයෙන් ලබාදෙන පිළිතුරු අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන අවශ්‍ය නිරවුල් කිරීම් සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,554,339ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.30,322,519ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 23,688 | 23,479 | 12,861 | 51,260 | 22,453 | 23,162 | 17,628 | 50,868 |
| කුලී | 45,631 | 41,638 | 35,836 | 47,957 | 45,727 | 35,041 | 34,105 | 38,102 |
| බලපත්‍ර ගාස්තු | 1,406 | 15,441 | 15,441 | - | 1,525 | 2,647 | 2,647 | - |
| වෙනත් ආදායම් | 3,454 | 10,126 | 5,710 | - | 24,000 | 23,788 | 23,593 | 93,980 |
| එකතුව | 74,179 | 90,684 | 69,848 | 99,217 | 93,705 | 84,638 | 77,973 | 182,950 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම්**<br>වරිපනම් අයවිය යුතු දේපළවලින් රු.51,259,586ක වරිපනම් මුදලක් අය විය යුතුව තිබුණි. | ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම මඟින් හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) **කුලී**<br>හිඟ කඩ කුලී හා බදු කුලී ආදායම රු.47,957,115ක් වූ අතර මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව හිඟ මුදල් අයකර ගැනීම හෝ කපා හැරීම සම්බන්ධයෙන් කටයුතු කරන බව. | හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභා සේවකයින් යෙදවීම මඟින් මාළු වෙළඳපළ, එළවළු වෙළඳපළ, රාත්‍රී වෙළඳපළ, රථගාල් හා වැසිකිළි ආදායම් රැස් කර තිබූ අතර එහිදී රැස් කරන ලද ආදායමෙන් වැටුප් හා විදුලිය සඳහා වන වියදම් අඩු කළ පසු ආදායම ඉක්ම වූ වියදම් පවතින බව නිරීක්ෂණය විය. | ටෙන්ඩර් කැඳවා ආදායම් රැස් කිරීමට කටයුතු කරන බව. | ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) ශර්ලි කොරයා ශාලාව 2017 වර්ෂයේදී හලාවත රෝහලට ලබා දී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිඳු ගිවිසුමකට එළඹී නොතිබුණි. නගර සභාව විසින් අයවිය යුතු කුලී මුදල් ලෙස රු.3,434,000ක් ලෙස ගණනය කර තිබුණද එම මුදල් අයකර ගෙන නොතිබුණි. | රෝහලට ලබාදුන් ගොඩනැගිලි ලබාදෙන ලෙස හා හිඟ මුදල් ගෙවන ලෙස දන්වා ලිපි මඟින් රෝහල් අධ්‍යක්ෂක දැනුවත් කර ඇති බව. | කුලී මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු ගිනි නිවන රථයක් 2016 වර්ෂයේ දී අනතුරකට ලක්ව රු.780,000ක අලාභයක් සිදුව ඇති අතර ඒ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කර අලාභ අයකර ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් නිර්දේශ දක්වා ඇති නමුත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | එම නිලධාරීන්ගේ අධිභාරය අයකර ගන්නා ආකාරය පිළිබඳ උපදෙස් පතා ලිපියක් යොමු කිරීමට කටයුතු කරන හෙයින් එම මුදල අයකර ගැනීම සිදු වී නොමැති බව. | පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ වායු සමීකරණ යන්ත්‍ර 21ක් මිලදී ගැනීම සඳහා රු.2,842,210ක වියදමක් දරා තිබුණි. සවිකර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් විදුලිබල ධාරිතාවක් නොමැති වීම හේතුවෙන් රු.692,337ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 07ක් ක්‍රියාත්මක කිරීමට නොහැකිව නිෂ්කාර්යව පැවති අතර භාවිතයට නොගන්නා මෙම යන්ත්‍රවල වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි. | මෙම වායුසමීකරණ යන්ත්‍ර විකුණා සෝලාපැනල් සවිකර කාර්යාලයට විදුලිය සපයා ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට ලිපියක් යොමුකර ඇති බව. | නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සැප්තැම්බර් මස 28 දින විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් මගින් වාහන භෞතිකව පරීක්ෂාවට ලක් කර ඉදිරිපත් කර තිබුණු සමීක්ෂණ වාර්තාව අනුව අපහරණය කිරීමට උපදෙස් දී ඇති සභාව සතු වත්කම් 05ක් අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති තක්සේරු වාර්තාවට අනුමැතිය ලද පසු අපහරණය කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණ වාර්තා අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ ඇති සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම්, ක්‍රීඩාපිටි හා සුසානභූමි ඉඩම් 39ක් පැවති අතර එම ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් සිටින බව. | කඩිනමින් ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවකයින් 118ක ඌනතාවයක්ද, සේවකයින් 14ක අතිරික්තයක්ද විය. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා වරින් වර ඉල්ලීම් සිදු කර ඇති බව. | අදාළ පුරප්පාඩු විධිමත් පරිදි සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණු ද ගොඩනැගිලි ඇතුළු වත්කම් කලමනාකරණය, ආදායම් ඉපයීම, මහජන සේවා සැපයීම, ගබඩා කලමනාකරණය, වීදි ආලෝක පහන් නඩත්තුව ආදී ක්ෂේත්‍රවල අභ්‍යන්තර පාලන දුර්වලතා හඳුනාගත හැකි වන අයුරින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගනණයට ලක් නොවූ ක්ෂේත්‍රයන් 2023 වර්ෂයේ හැකිතාක් දුරට විගණනය කිරිමට කටයුතු කරන බව. | සියළු අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 81ක් සඳහා සලසාගෙන තිබුණු රු.8,233,600ක් වූ ප්‍රතිපාදිත මුදල් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | නගර සභාව විසින් ව්‍යාපෘති අයවැයක් පිළියෙල කරන බැවින් එක් එක් ව්‍යාපෘතියේ වැය ශිර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන බව. | අයවැය ගත කාර්යයන් ලඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 43ක් සඳහා සලසාගෙන තිබුණු රු.14,269,400ක් වූ ප්‍රතිපාදිත මුදලින් සියයට 50 සිට සියයට 98 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | ආර්ථික අර්බුද හා ජාතික අයවැය චක්‍රලේඛනයන්ට අනුව වියදම් පාලනය කිරිමට සිදු වූ බව. | අයවැය ගත කාර්යයන් ලඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර අරමුණු 15ක් ඉටු කර ගැනීම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් 13ක් සම්පූර්ණයෙන් ඉටුකර නොතිබූ අතර ක්‍රියාකාරකම් 19ක ප්‍රගතිය සියයට 0.06 සිට සියයට 95.06 දක්වා පරාසයක පැවතුණි. | ආර්ථික අර්බුද හා ජාතික අයවැය චක්‍රලේඛනයන්ට අනුව වියදම් පාලනය කිරිමට සිදු වූ බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කවලට ලඟාවීමට කටයුතු කළ යුතුය. |